

# ඉන්දීය අහසේ සුදු - ඇස

White - eye හෙවත් Zosterops Palpebrosa යන උද්භිද විද්‍යාත්මක නමින් හඳුන්වන මෙම කුරුල්ලා ඉතා කුඩාය. කලබල සහිතය. සෙ.මී. 10 ක් තරම් වූ මෙම කුරුල්ලාගේ පපු ප්‍රදේශය අවර්ණ වූ සුදු පැහැතිය. වලිග ප්‍රදේශයේ සැඟවුන කහ වර්ණයක් ඇත. නිකට සහ හොට ප්‍රදේශය දීප්තිමත් කහ වර්ණයෙන් යුක්තය. ඇස වටා ඇති සුදු පැහැති රවුම මෙම කුරුල්ලාගේ විශිෂ්ට ලක්ෂණයක් වන අතර ස්ත්‍රී / පුරුෂ විශේෂ දෙකටම මෙම පිහිටීමේ වෙනසක් නැත.

ඉන්දියාවට ආවේණික මෙම කුරුලු වර්ගය කාන්තාර කලාපය හැරුන විට අනෙකුත් සියළුම ප්‍රදේශවල ව්‍යාප්තව සිටිති. හිමාලයේ සිට අඩි 8000 ක් පමණ උස ප්‍රදේශවල මුන ගැසෙන සුදු - ඇස කුරුල්ලා ගස්, උද්‍යාන, කැලෑබද ප්‍රදේශ සහ දූව ආශ්‍රිතව වාසය කරති. තෙතමන සහිත වනාන්තරවලට මොවුන් විශේෂ ප්‍රියතාවයක් දක්වනු ලබයි.

ගස් ආශ්‍රයේ සිටින මොවුන් ඉඳහිට භූමි ප්‍රදේශවලට පැමිණෙති. සිහින් වූ තියුණු හොට තුළින් මල් පැණි උරාබීම පහසුහය. මෙම කුරුල්ලා විසින් මල්වල පරාගනය සිදු කරන නිසා මල් කුරුල්ලාFlower - bird නමින්ද හඳුන්වනු ලැබේ. ගස් ආශ්‍රිතව ආහාර සොයන ඔවුන් උඩ සිට පහළට එල්ලී මල් ආශ්‍රිතව සිටින කෘමීන් ගොදුරු කොට ගනී. මොවුන්ගේ ආහාර වට්ටෝරුව අතර සිටින්නේ කෘමීන්, මකුළුවන්, පලතුරු සහ බෙරි වර්ගයි.

tutee - tutee නාද නගන මෙම කුරුල්ලා සංස්කෘත බසින් හඳුන්වන්නේ Saranga නමින් ය. අප්‍රේල් සිට ජූලි මාසවලදී ඔවුන්ගේ ප්‍රජනනය සිදුවේ. ලිංගික උත්තේජනය දැනුන විට පිරිමි කුරුල්ලා ගස් මුදුන්වල සිට මිහිරි ශබ්ද නගනු ලැබේ. කෝප්පයක හැඩ ඇති කූඩුව නිර්මාණය වන්නේ සිහින් තණකොළ වලින් ය. පාසි, තන්තු ආදියෙන් සියුම්ව පිළියෙළ වුන කූඩුව අත්තක එල්ලා තබයි. කූඩුව තැන්පත් කරන පඳුර හෝ ගස භූමියේ සිට අඩි 3 - 10 අතර උසකින් යුක්තය. වරකට බිත්තර 2 සිට 3 අතර ප්‍රමාණයක් දමනු ලැබේ. මලානික නිල් පැහැති මෙම බිත්තර දින 10 සිට 11 ත් අතර රකිනු ලැබේ. කූඩුව පිළියෙල කිරීම, බිත්තර රැකීම සහ පැටවුන් රැක බලා ගැනීමට කුරුලු දෙමහල්ලන්ම සම්මාදම් වේ.



මව්පිය රැකවරණය ලබා නිසි වයසට පත් සුදු - ඇස කුරුලු පැටවුද කූඩුවෙන් පිටව ගොස් ස්වාධීන ජීවිතයක ආරම්භයක් කරති.

❑

**පුනයා චාන්දනී ද සිල්වා**